# පර්යේෂණ වලින් හෙළි වන තොරතුරු ගැන උනන්දුවක් ඕනෑ

**සුළු අපනයන බෝග වවන ඉන්දියානු සුළු ගොවීන් පර්යේෂණ වල තොරතුරු පිටවන්නටත් කලින් ඒවා සොයාගෙන ව්‍යාප්ති නිලධාරීන් පස්සේ එළවනවා. ශ්‍රී ලංකාවේ තත්වයද මේ මට්ටමට ගෙන ඒම සියල්ලන්ගේ වගකීමයි.**

ශ්‍රී ලංකාවේ මෙන් ම ඉන්දියාවේ ද සුළු අපනයන බෝග වගාකරුවන් වැඩි වශයෙන් ම සුළු ඉඩම් හිමියන්ය. දැනට තිබෙන මධ්‍යම ප්‍රමාණයේ ඉඩම් ඒකකයන් ද දිනෙන් දිනම වැඩි වන ජනගහණ පීඩනය නිසාවෙන් සුළු ඉඩම් බවට පත් වන දිනය එතරම් ඈත නොවෙයි. මේ නිසාවෙන් පැහැදිලි වම මෙම බෝග වගාවන් සුළු ඉඩම් හිමියන් ගේ ආර්ථික ඒකක වනු නිසැකය. ලොකු ඉඩම් හිමි යන් මෙන් නොව සුළු ඉඩම් හිමියන් ඉතා අකාර්යක්ෂම නිෂ්පාදක යන් බවට ඇතමුන් දරණ මතයට මම කිසිසේත් ම එකඟ නැහැ. ගුවන් විදුලිය, ප්‍රවෘත්ති පත්‍ර හා ව්‍යාප්ති සේවා හා වෙනත් ප්‍රචාරක මාධ්‍යයන් මගින් ඔවුන් වෙත ඉදිරිපත් කරන නව වගා පිළිවෙත්වලට ඔවුන් නැඹුරු නොවන බවට කෙරෙන චෝදනාවල ද එතරම් සත්‍යයක් නැහැ. කුඩා ඉඩම් ඒකක වැඩි හරියක් ඉතා යහපත් ආර්ථික ඒකක බව පැහැදිලිව පැවසීමට මම කැමැත්තෙමි. මෙය මගේ මව් රටේ දී ලැබූ අත්දැකීමක් වුව ද, ශ්‍රී ලංකාවේ දී මෙතෙක් මා ලබා ඇති අත්දැකීම් අනුව මෙය ඔබේ රටට ද බලපාන සත්‍යයක් බව පැවසිය හැක.

සුළු අපනයන බෝග වගාව පිළිබඳ තම අදහස් දක්වමින් එසේ පැවසුවේ දැනට අපේ සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවට අනුබද්ධ එක්සත් ජාතීන් ගේ කුළු බඩු විශේෂඥයකු ලෙසින් සේවය කරන ආචාර්ය කේ. බී. ඒ. බාවප්පා මහතා ය. සිය මුළු වෘත්තීය සේවා කාලයම වැවිලි බෝග සඳහා කැප කර ඇති ඔහු මෙම බෝග වලට අදළ විවිධ තනතුරු රැසක් දරා පසුව වැවිලි බෝග සඳහා වන ඉන්දියානු සංගමයේ සභාපති තනතුරට ද පත් වී ඇත. 1970 සිට 1976 දක්වා ඉන්දියාවේ මධ්‍යම වැවිලි බෝග පර්යේෂණායතනයේ අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කර ඇති බාවප්පා මහතා 1977 සිට සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවට සම්බන්ධව කටයුතු කරයි.

**ඉන්දියාවේ වගා බිම් වලින් සුළු අපනයන බෝග සඳහා කැපව ඇත්තේ 2% ක් වුව ද, වසරකට රුපියල් දශ ලක්ෂ 3700 ක් පමණ විදේශ විනිමයක් එමගින් ලබන බව පැවසූ ඔහු මෙය කෘෂි නිෂ්පාදන අපනයන ආදයමෙන් 3/4, ක්ද ජාතික අපනයන ආදයමෙන් 1/4 ක් බව ද, පැවසුවේ කුළු බඩු නිපැයුමේ ඇති ආර්ථිකමය වටිනාකම තවත් තහවුරු කර ලීමට ය.**

මෙම හැඳින්වීමෙන් පසුව බාවප්පා මහතා දැක්වූ සෙසු අදහස් සුළු අපනයන බෝග සංවර්ධනය කිරීමට මූලික පියවර ගන්නා

අපට ද මහඟු ප්‍රයෝජන අත්වනු නිසැකය. කුළු බඩු සඳහා ලෝක වෙළඳ පොලේ ඇති ඉල්ලුම තව බොහෝ කාලයක් දුන් වෙන් ම වර්ධනය වෙමින් පවතිනු ඇත. මෙම අස්වනු වැඩි කිරීමට සෑම රටක් ම උත්සාහ දැරුව ද වෙළඳ පොල අතිරික්ත යක් ඇති නොවන හෙයින් වගා බිම් හා අස්වනු වැඩි කිරීමේලා කිසිදු බියක් ඇති කර ගත යුතු නැති බවද ඔහු පෙන්වා දුන්නේය.


එහෙත් අප මුහුණ පා ඇති මූලික ප්‍රශ්න යව ඇත්තේ දැනට පවතින වගාවන්හි ඇති දුර්වල තත්වයන්ය. දැනට ඇති වගා වන් බොහොමයක් අඩු පලදා දෙන නො දියුණු වර්ගයේ ඒවා වීම මීට ප්‍රධාන බාධාවයි. වැඩි අස්වනු දෙන නව ප්‍රභෙද සොයා ගැනී මට සෑහෙන කලක් ගත වේ. මෙය අධික වියදම් දැරීමට සිදුවන දෙයක් වන අතර, උසස් ප්‍රභෙද ඇති රටවල් ඒවා සෙසු රට වලට නොදීම ද තවත් බාධාවක් බව පැවසූ බාවජ්පා මහතා මෙය තහවුරු කලේ ඔහුගේ අත්දැකීම් හෙළි කරමිනි. ඔහු ජැමෙයිකාවට ගිය විටෙක ජැමෙයිකාවේ සුප්‍රකට 'සියළු ම කුළු බඩු ගහ' බැලීමට පවා ඔහුට අවස්ථාවක් දී නැත. සැන්සිබාරයෙන් කරාබු පැලයක් බැහැර කිරීම මරණීය දඬුවම් දිය හැකි වරදකි. ඉන්දියාවේ ප්‍රකට වැඩි අස් වනු ගම්මිරිස් වර්ගයක් වන පන්යූර් වර්ගය ද වෙන රටවලට නොදෙන නමුදු ඔහු මෙහි එන විට කෙසේ හෝ ලංකාවේ එම වර්ගය තිබීම ශ්‍රී ලංකාවේ ගම්මිරිස් වගා වන්ට හොඳ අනාගතයක් ඇති බවට කදිම සාධකයක් බව ද පැවසුවේ ය. මේ පටු තත්වය නැතිකර ජාත්‍යන්තර මට්ටමේ සහයොගිතාවයකින් කුළු බඩු උසස් ප්‍රභෙද බිහි කිරීමට කටයුතු කළයුතු බව ද ඔහු අවධාරනයෙන් පැවසුවේ ය.

කුළු බඩු වගාවන්ට වැළඳෙන ලෙඩ රෝග මර්ධනය කිරීම සෑහෙන අමාරු කාරියක්ව ඇති බව පැවසූ ඔහුට මෙහිලා රෝගවලට ඔරොත්තු දෙන වඩා උසස් තත්වයේ ප්‍රභෙද බිහි කිරීමට කටයුතු කළ යුතු බවද පැවසීය.

වඩා හොඳ ප්‍රභෙද සොයා ගත්තත් අද පවතින ප්‍රධාන ප්‍රශ්නය අස්වනු වැඩි කර කාර්යක්ෂම වඩා ඉහළ වගා පිළිවෙත් භාවිතයට ගැනීම යි. දැනට මෙම වගාවන් කෙරෙනුයේ කිසිදු වගා පිළිවෙත් භාවිතා වක් නොමැතිව, පෝර දැමීමක් නොකර, ලෙඩ රෝගවලට ප්‍රතිකාරයක් නොමැතිව ඉබේම වැවීමට හැරීමෙනි. මෙම තත්වයන් මග හැර අප වඩා දියුණු වගා පිළිවෙත් හා යෙදවුම් භාවිතා කර මෙම බෝග වගාවේ යෙදීම එය කලබලකාරීව කළයුත්තක් නො වන බව පැවසූ බාවජ්පා මහතා ඊට උද හරණයක් දක්වූයේ කුරුඳු වගාවෙනි. පොල් ඉඩමක ජල පහසුව යටතේ අතුරු බෝග යක් ලෙස කුරුඳු වගා කිරීමෙන් ලැබෙන් නේ ඉතා බාල තත්වයේ ගනකම් පොත්තක් බව ඔහු පෙන්වා දුනි. මෙයට ලැබෙනුයේ ඉතා අඩු මිළකි.

**අනිවාර්යයෙන් ම මෙම වගාවන් සුළු ඉඩම් හිමියන් ගේ බෝගයන් වන හෙයින් අප විසින් සකස් කෙරෙන නව වගා පිළි වෙත් හා අදාල ක්‍රියාදමයන් සුළු ඉඩම් හිමියන්ට ගැලපෙන අයුරින් සකස් විය යුතුමය. ඉඩම් කට්ටි ප්‍රමාණය කුඩා වත්ම ඉඩම් හිමියා නිතැතින් ම වෙනත් අතිරේක ආදායම් සොයායයි. තම ඉඩම් කැබැල්ලේ එක් බෝගයක් වෙනුවට ඔහු වෙනත් බෝග කිහිපයක් ම වැවීම ගැන කල්පනා කරනු නිසැකය. මෙහිදී අප ගොවීන් අතුරු බෝග වගාවන් ගැන සිතනවා වගේ ම මිශ්‍රබෝග වගාවන් ඔවුනට හඳුන්වා දිය යුතුය. මේ හෙයින් අපේ දැඩි අවධානය මෙවැනි කුඩා ඉඩම්වල වැවිය හැකි මිශ්‍ර වගාවන් හා මෙම ඉඩම් හිමියන් ජීවත් වන පරිසර තත්වයන්ට ගැලපෙන හා ඔහුට හිත වගාවන් බිහි කර ලිම කෙරෙහි යොමුවිය යුතුය.**

මෙවැනි වගා රටාවක බිහි කිරීමේ දී ඉතා අඩුවියදම් යෙදෙන පවුලේ ශ්‍රමය පම ණක් ඉඩමට යෙදෙන අඩු යෙදවුම් ප්‍රමාණය කින් ඉහළ ම ප්‍රයෝජන ලැබෙන වගා



මෙරටට යුදුසුභාවය පිළිබඳව පරීක්පණ වලට භාජනය වෙමින් මීට වැඩි පළදාවදෙන ඉන්දියානු කෝපි වර්ගයක්

රටාවක් සකස් විය යුතු ය. වගාවන්ට අමතරව ඊට පොහොර ලබා ගත හැකි වන පරිදි කිරි පට්ටියක් හෝ කුකුල් කොටු පවත්වා ගෙන යාමේ ඉඩකඩ ද මෙම සුළු ඉඩම් හිමියන්ට ලබා දිය යුතු ය. මෙය ඔවුනට තවත් අතිරේක ආදායම් මඟක් වනු නිසැකය. සෙසු ප්‍රධාන බෝග මත ජීවත් වන ජනතාවකට වඩා පහසු ජීවන මඟක් මෙවැනි වගා රටාවක් යටතේ කුළු බඩු වගා කරන ජනතාවට ලබා ගත හැකි වනු ඇත. එහෙත් මෙම වගාවන් පිළිබඳව වන නව වගා පිළිවෙත් හා සෙසු වැදගත් තොර තුරු ගැන මෙම ඉඩම් හිමියන් තුළ මනා අවබෝධයක් තිබීම අත්‍යවශ්‍යව ඇත. මෙහිලා ඉන්දියානු ගොවියන් ගේ අත්දැකීම් ඉතා සතුටුදායක බව පැවසූ බාවප්පා මහතා ඇතැම් පර්යේෂණවල තොරතුරු පිටවන්නටත් කලින් ගොවි ජනතාව ඒවා සොයා ව්‍යාප්ත නිල ධාරීන් පස්සේ එලවීම ඔවුන් නව විද්‍යාත්මක ක්‍රම කෙරෙහි දක්වනු ලබන උනන්දුව පැහැදිලි කරන්නක් බව පැවසුවේය. ශ්‍රී ලංකාවේ තත්වය ද මේ මට්ටමට ගෙන ඒම සියල්ලන් ගේම වගකීමක් බව ද ඔහු පෙන්වා දුන්නේ ය.

ගොවීන් ගේ වියදම් අඩු කෙරෙන අතර ඔහු ගේ ආදායම් මාර්ග වැඩි කිරීම දූන් පොදුවේ සාකච්ඡාවට භාජනය වන මාතෘකාවකි. මෙහිලා ගොවින්ට පිහිට විය හැකි මඟක් ලෙස රජයේ ආධාර ඇතිව පිහිටුවන සමූපකාරය දැක්වුව ද බොහෝ විට අත් දැකීම වන්නේ පෞද්ගලික අංශය මගින් කෙරෙන සේවාවන් ඉටු කිරිමේලා සමූපකාර පසු බැස ඇති බව ය. එහෙත් හුදෙක් තම නිෂ්පාදන අමුද්‍රව්‍ය වශයෙන් අතරමැදියන්ට විකුණා සුළු මිළක් ලබා ගැනීම වැලැක්වීමට ගොවීන් කුළු බඩු වෙළඳාමේ ඉතා වැදගත් අවස්ථාවක් වන නිෂ්පාදන වර්ග කිරීම්, ශ්‍රේණි කිරීම් වැනි සැකසුම් කටයුතු පිළිබඳව අවබෝධයක් ඒවා වවන්නන්ට ලබා දීම බව පැවසූ බාවප්පා මහතා මෙහිලා මැදිහත්වීම රජයේ වගකීමක් බව ද පෙන්වා දුනි.

තම ගමේ හෝ ගම් කිහිපයක ගොවීන් ගේ දුම්බාන සකස් කර ගැනීමට මුදලින් හා දූනීමෙන් ආධාර කිරීම අතරමැදියන් ගේ ග්‍රහණයෙන් ඔවුන් මුද ගැනීමට හැකි එක මඟකි. තම නිෂ්පාදනවලට ඉහළ මිලක් ලැබෙන්නේ ඒවා පිටරටවලට අපනයනය කිරීමේ දී අනුකූල විය යුතු ප්‍රමිති පිරිවිතර වලට එකඟ වන්නේ නම් පමණක් බව දන්නා ගොවීන් ඇත්නම් ඒ ඉතා අතලොස් සකි. ඔවුන් මහන්සි වී නිපදවන නිෂ්පාදන මෙම ප්‍රමිතිවලට අනුකූලවන සේ සකස් කිරීම පමණක් කරන පුද්ගලයන් ඉන් වැඩි ලාභ ලැබීම සතුටුදායක තත්වයක් නොවේ. මෙහිලා ගොවීන්ට තමන් ගේ නිෂ්පාදන අවසානයේ යවනුයේ පිටරට වෙළඳ පොළකට බවත් ඉන් ලැබෙන මුදලින් වැඩි කොටස තමා වෙත ඇද ගැනීමට නම් ප්‍රමිති පිරිවිතරවලට අනුකූල වන සේ නිෂ්පාදන සකස් කිරීම පිළිබඳ අවබෝධ ලබාතිබීම වැදගත් බවත් අවබෝධ කරදිය යුතුය. මෙය අදාළ රජයේ ආයතනවල වගකීමක් වේ.

මේ අනුව බලන කළ කුළු බඩු නිෂ්පාදනය වැඩි දියුණු කිරීමට මූලික කටයුතු යොදා ගෙන යන මේඅවස්ථාවේ කළයුතු වැදගත් ක්‍රියා දමයක් වනුයේ වඩා හොඳ වගා පිළිවෙත්, යෙදවුම් භාවිතය මෙන් ම නිෂ්පාදන ශ්‍රේණි කිරීම් හා අදාල සියළු ම කටයුතු පිළිබඳව ජනතාවට අවබෝධයක් ලබාදීම ය. එක සාදික්කා ගසක් හෝ කරාබු ගසක් ඇති පුද්ගලයෙකුට වුව ද මේ සියළු ම කරුණු පිළිබඳව අවබෝධයක් ලබා දීම ව්‍යාප්ති සේවාවන්හි වගකීම විය යුතුය. මෙවැනි අවබෝධයෙන් පිරිවාතාවරණයක් ඇති නොකොට කිසිම සංවර්ධන සැලැස්මකින් පුළුල් ප්‍රයෝජන ලබා ගත නොහැකි බව ද බාවප්පා මහතා වැඩිදුරටත් පැවසීය.